❑ අංක 01 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

1. පුරවැසියන්ගේ බාහිර හැසිරීම පාලනය කිරීම සඳහා රජය විසින් හෝ අධිකාරී බලය සහිත ආයතනයක් විසින් හෝ පනවන ලද රෙගුලාසි මාලාව වන්නේ,

i. නීතියයි.
ii. රෙගුලාසි වේ.
iii. ආචාර ධර්ම වේ.
iv. යුක්තියයි.

2. සාධාරණ හැසිරීම හෝ සාධාරණ සැලකීම නැතහොත් අපක්ෂපාතීව ක්‍රියාකිරීම.

i. නීතියයි.
ii. යුක්තියයි.
iii. සාධාරණත්වයයි.
iv. නිර්භීතකමයි.

3. නීතියේ ගුණාංගයක් නොවන්නේ මින් කුමක්ද?

i. අධිකාරී බලය පදනම් කරගෙන රජය විසින් පැනවීම.
ii. පොදු සමාජ යහපත අරමුණු කර ගනිමින් පනවා තිබීම.
iii. නීති කඩකිරීම් දඩුවම් ලැබිය හැකි වරදක් වීම.
iv. අධිකරණයක් තුළ විභාග කිරීම.

4. යුක්තිය පසිඳලීමේ පූර්ව කොන්දේසියක් නොවේ,

i. තමාට ඇති චෝදනාව දැනගැනීමට ඇති අයිතිය
ii. අධිකරණය ඉදිරියේ තමා ම හෝ නීතිඥයෙකු මඟින් හෝ කරුණු ඉදිරිපත් කිරීමට ඇති අයිතිය
iii. සිරගත කළ නොහැකිවීමේ අයිතිය
iv. සාධාරණ හා අපක්ෂපාතී විනිශ්චයක් ලබා ගැනීමට ඇති අයිතිය

5. නීති මූලාශ්‍රයක් නොවේ,

i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
ii. දේශපාලඥයින්ගේ මතවාද
iii. අධිකරණ තීන්දු
iv. නීති විශාරදයින්ගේ මතවාද

6. නීතිය ක්‍රියාත්මක කරන ආකාරය අනුව, බෙදෙන කොටස් දෙක වන්නේ,

i. දේශීය හා අන්තර්ජාතික නීතිය
ii. සිවිල් නීතිය හා අපරාධ නීතිය
iii. දේශීය නීතිය හා සිවිල් නීතිය
iv. සිවිල් නීතිය හා මූලික නීතිය

7. මිනී මැරීම්, මංකොල්ලකෑම්, ස්ත්‍රී දූෂණ, මත්ද්‍රව්‍ය අලෙවි කිරීම ආදී වැරදි ක්‍රියා සඳහා දඩුවම් ලබාදෙන්නේ කුමන නීතිය මඟින් ද?

i. සිවිල් නීතිය
ii. අපරාධ නීතිය
iii. මූලික නීතිය
iv. උඩරට නීතිය

8. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඉහළ ම අධිකරණය කුමක්ද?

i. ශ්‍රේෂ්ඨාධිකරණය
ii. රාජාධිකරණය
iii. දිසා අධිකරණය
iv. අභියාචනාධිකරණය

9. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශේෂ නීති හෙවත් පුද්ගල නීතියක් නොවේ,

i. උඩරට නීතිය
ii. කතෝලික නීතිය
iii. තේසවලාමේ නීතිය
iv. මුස්ලිම් නීතිය

10. ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රධානියා කවුද?

i. නීතිපති
ii. අගමැති
iii. අගවිනිසුරු
iv. ජනාධිපති

❑ **ප්‍රශ්න දෙකට ම නිවැරදි පිළිතුරු සපයන්න**

1.

i. **නීතිය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ විද්වතුන් දෙදෙනෙකු නම් කරන්න.**

ii. **නීති මූලාශ්‍ර තුනක් දක්වන්න.**

iii. **රාජ්‍යයක ක්‍රියාත්මක වන නීතියක දැකිය හැකි මූලික ලක්ෂණ තුනක් නම් කර, ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.**

2.

i. **නීතිය බෙදෙන ප්‍රධාන කොටස් දෙක කුමක් ද?**

ii. **දේශීය නීතියේ ප්‍රභේද තුන නම් කරන්න.**

iii. **ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සෙසු නීති හෙවත් පුද්ගල නීති තුන දක්වා, ඉන් එකක් පිළිබඳ සැකෙවින් විස්තර කරන්න.**